**2020 අංක 01 දරන විස්තර සටහන**

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**2020 මාර්තු 25**

**කොවිඩ් -19 මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින් සඳහා සහන සැලසීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග යන මැයෙන් නිකුත් කරන ලද 2020 අංක 04 දරන චක්‍රලේඛය සම්බන්ධයෙන් වන අර්ථ දැක්විම**

කොවිඩ් -19 වසංගතය මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින් සඳහා සහන සැලසීමට 2020 මාර්තු 24 දින නිකුත් කරන ලද 2020 අංක 04 දරන චක්‍රලේඛය සම්බන්ධයෙන් වන අර්ථ දැක්විම පහත පරිදි වේ.

1. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කැබිනට් මණ්ඩල තීරණයට සමගාමීව බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ද ඇතුලුව ලීසිං සමාගම් වෙත ඉහත චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2. ඉහත චක්‍රලේඛයේ අයිතම අංක 01 සහ 02 සඳහා වන ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කිරීමට මූල්‍ය සමාගම් විසින් ගනුදෙනුකරුවන් හට 2020.04.30 දින දක්වා කාලය ලබා දිය යුතු අතර එම ඉල්ලීම් සඳහා සමාගමේ අවසාන තීරණය දින 45 ක් ඇතුලත ගනුදෙනුකරු වෙත දැනුම් දිය යුතුය.

3. ඇඳිරි නීතිය නොමැති දින වලදී මූල්‍ය සමාගම්වල සියලුම ශාඛා අවම සේවක සංඛ්‍යාවක් සහිතව පෙ.ව. 8.00 සිට ප.ව. 1.00 දක්වා විවෘතව තැබිය යුතුය.